## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුර සඳහා බඳවා ගැනීම

ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. රැකියා විස්තරය සහ වගකීම්

I. ආයතනයේ පරිගණක ජාලය සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම.

II. පද්ධති ආකෘතිය සැලසුම් කිරීම, පද්ධති ස්ථාපනය මෙහෙයවීම සහ පද්ධති ප්‍රමිතීන් නිර්වචනය කිරීම, ප්‍රලේඛනගත කිරීම සහ බලාත්මක කිරීම මගින් ජාලකරණ පරිසරය ස්ථාපිත කිරීම .

III. අනවසර අයට ඇතුළු විය නොහැකි සේ යොදා ඇති පරිගණක ආරක්ෂණවල (Firewall) කාර්ය සාධනය අධීක්ෂණය කිරීම, ජාල ගැටළු සහ ඇනහිටීම් දෝෂ නිරාකරණය කිරීම, යාවත්කාලීන කිරීම, සැලසුම් කර ඇති පරිදි අළුත්වැඩියා කිරීම් සහ වැඩිදියුණු කිරීම් සිදු කිරීම මෙන්ම ජාල ප්‍රශස්තිකරණය පිළිබඳ ජාල නිර්මාණ ශිල්පීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් ජාල කාර්ය සාධනය කාර්යක්ෂම කිරීම.

IV. ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ බලාත්මක කිරීම සහ ප්‍රවේශය සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම මගින් ජාල පද්ධතිය සුරක්ෂිත කිරීම.

V. ජාල ආරක්ෂණ පියවරයන් සම්බන්ධීකරණය කිරීම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් දත්ත, මෘදුකාංග සහ දෘඩාංග ආරක්ෂා කිරීම.

VI. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රකාරව පරිගණක ආරක්ෂණ පද්ධතිය (Firewall) පවත්වාගෙන යාම කිරීම.

VII. විවිධ අංශවල පද්ධති අවශ්‍යතා නිර්ණය කර සහයෝගයෙන් කටයුතු කිරීම.

VIII. ඉහළ මට්ටමේ නිෂ්පාදන පිරිවිතර සහ නිර්මාණ ලේඛන සකස් කිරීම.

IX. අනෙකුත් අංශවල සහාය ඇතිව අධ්‍යයනය කිරීම සහ විශ්ලේෂණය කිරීම සහ ඩිජිටල් පරිවර්තනය සඳහා මෘදුකාංග, දෘඩාංග සහ යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනා ගැනීම.

X. දත්ත සමුදායන්, මූලාශ්‍ර කේතය සහ එහි උපස්ථවල වාර්තා සුරක්ෂිතව සහ ආරක්ෂිතව තබාගැනීම සහ උපදෙස් ලේඛනගත කිරීම.

XI. සම්මත යෙදවුම් සහ භාවිතයන් ආධාරයෙන් දත්ත දෘශ්‍යමාන කිරීමට BI විසඳුම් සංවර්ධනය කිරීම.

XII. පද්ධති මෘදුකාංග, යෙදුම් මෘදුකාංග, දෘඩාංග සහ ආකෘතිය ඇතුළු පරිගණක ජාලය සහ අදාළ පරිගණක පරිසරයන් නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම.

XIII. මෙහෙයුම් පද්ධති සහ යෙදුම් සඳහා සහායක සේවා සැපයීම.

XIV. දෘඩාංග, මෘදුකාංග සහ අනෙකුත් ජාල සහ පද්ධති ගැටළු/දෝෂ හඳුනාගැනීම සහ නිරාකරණය කිරීම. දෝෂ සහිත ජාල සහ දෘඩාංග සංරචක අවශ්‍ය විට ප්‍රතිස්ථාපනය කිරීම.

XV. තොරතුරු ආරක්ෂණ නිලධාරියා (ISO) ලෙස ක්‍රියා කිරීම සහ රජයේ චක්‍රලේඛ සහ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

XVI. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රශස්ත භාවිතයන් සහ නව තාක්ෂණයන්ට අනුගතවීම මගින් විද්‍යුත් රාජ්‍ය සහ විද්‍යුත් පාලන සංකල්ප ස්ථාපිත කිරීම සඳහා මාර්ගෝපදේශ සහ සහාය ලබා දීම.

XVII. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය අධීක්ෂණය, යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම.

2. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:

අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ විෂයය පිළිබඳ 1 වන හෝ 2 වන පන්තියේ (විශේෂ) උපාධියක් ලබා තිබීම

- හෝ -

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික/ආශ්‍රිත (Corporate/Associate) සාමාජිකත්වය ලබා තිබීම

සහ

පළපුරුද්ද

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 3ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම

- හෝ-

දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර 3 ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

සහ

වෙනත් අවශ්‍ය සුදුසුකම්

සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ට දත්ත සමුදා කළමනාකරණය සහ සම්මත මෘදුකාංග පැකේජ පිළිබඳ කොමිෂන් සභාව තීරණය කරන මට්ටමේ මනා දැනුමක් තිබීම.

සහ

ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂා පිළිබඳ විශිෂ්ට සන්නිවේදන කුසලතාවක් (ලිඛිත සහ වාචික) තිබීම.

4. බඳවා ගැනීමේ පටිපාටිය

බඳවා ගැනීම තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ. විභාගය සමත් වීමට සෑම ප්‍රශ්න පත්‍රයකින්ම අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

තරඟ විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් සමස්ථ ලකුණු පදනම්ව කුසලතා අනුපිළිවෙලට පත්වීම් සිදු කරනු ලැබේ.

ලිඛිත විභාගයේ විෂයයන්

01. සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය - පැය 1 ප්‍රශ්න පත්‍රය

02. විෂයය දැනුම
(තනතුරට අදාළව) - පැය 2 ප්‍රශ්න පත්‍රය

03. කළමනාකරණ කුසලතා - පැය 2 ප්‍රශ්න පත්‍රය

**5. වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**6.** වැටුප

තනතුර සඳහා මූලික වැටුප රු. 93,840.00 කි

**7. කොන්දේසි සහ අයදුම් කිරීමේ ක්‍රමය**

I. අයදුම්කරුවන් තනතුර සඳහා අයදුම් කිරීම සඳහා සුදුසුකම්ලත් අය ලෙස සලකනු ලබන්නේ ඔහු/ඇය අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පෙර ඉහත දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් පමණි.

II. බඳවා ගැනීම සම්පූර්ණයෙන් හෝ කොටසක් කල්දැමීම/අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.

III. අවශ්‍ය මූලික සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ජායා පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත දක්වා ඇති සබැඳියෙන් අයදුම්පත් බාගත කළ හැකිය.

IV. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර ඊට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

V. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

<u>**සියලුම අයදුම්පත් 2024.04.09 දින හෝ**</u> එදිනට පෙර අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු කාර්යාලය වෙත භාර දීම සිදු කළ යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සහකාර අධ්‍යක්ෂ/තොරතුරු තාක්ෂණ තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ/තොරතුරු තාක්ෂණ තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්):..........................................................................................................
2. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :..........................................................................................................
3. සම්පූර්ණ නම (සිංහලෙන්) :..........................................................................................................
4. උපන් දිනය :..........................................................................................
5. ස්ථිර ලිපිනය :..........................................................................................................
6. දුරකථන අංකය :.................................... විද්‍යුත් තැපැල් ලිපිනය :.............................................
7. අධ්‍යාපන සුදුසුකම් :

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

8. වෘත්තීය සුදුසුකම් :

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

9. වෙනත් සුදුසුකම් :

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

10. පළපුරුද්ද:

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

11.. අමුණා ඇති සහතිකපත් පිළිබඳ විස්තර :

I. ..........................................................................................................
II. ..........................................................................................................
III. ..........................................................................................................
IV. ..........................................................................................................
V. ..........................................................................................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තනතුරට තෝරා ගැනීමට පෙර පෙනී ගියහොත් මගේ අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, තනතුරට බඳවා ගැනීමෙන් පසු එවැනි තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය බවට අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කරන බවත් මම දනිමි. එමෙන්ම මම සියලු නීතිරීතිවලට යටත් වන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

............................ ......................................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය: (රජයේ ආයතනවල අයදුම්කරුවන් සඳහා)**

…....................................................................................................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................. තනතුරේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන අතර, ඔහුට/ඇයට එරෙහිව දැනට කිසිදු විනය ක්‍රියාමාර්ගයක් නොමැති බවත් ඉදිරියේ දී එවැන්නක් පැනවීමට තීරණයක් ගෙන නොමැති බවත් මෙයින් සහතික කරමි.

දිනය ................................ ..........................................

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

නම: ..........................................................................................................................................

තනතුර:- .....................................................................................................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය:- .......................................................................................................

නිල මුද්‍රාව :